# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**9 ශ්‍රේණිය**

## ගණිතය

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1) $1001_{දෙක} + 111_{දෙක}$ සුළු කරන්න.

2) $1kg$ න් $\frac{2}{5}$ ක් ග්‍රෑම් කීයද?

3) දුනුහිත විදේශ රැකියාවක නියුතු අයෙකි. ඔහුගේ මාසික වැටුප ඇමරිකානු ඩොලර් 1000ක් නම් එය ශ්‍රී ලංකා රුපියල් කීයද? (ඇ. ඩො. 1 = ශ්‍රී ලංකා රු. 361.72)

4) විසඳන්න. $\frac{x}{5} + 1 = 4$

5) 0.297 ආසන්න දෙවන දශමස්ථානයට වටයන්න.

6) රූපයේ දක්වා ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




7) පැත්තක දිග $10cm$ වූ ඝනක හැඩැති භාජනයේ ධාරිතාවය ලීටර් වලින් සොයන්න.

8) පහත එක් එක් අවස්ථාවේ දී ඇති රාශි දෙක අනුලෝම වශයෙන් සමානුපාත වේ නම් ඉදිරියෙන් දක්වා ඇති කොටුව තුළ ✓ ලකුණ යොදන්න.

| | | |
|---|---|---|
| i. | පිටු 40ක පොත් ගණන සහ ඒවායේ මිල | |
| ii. | ඒකාකාර වේගයෙන් ගමන් ගන්නා වාහනයක් ගමන් කරන කාලය හා දුර | |
| iii. | යම් ගමනක් යාමට ගතවන කාලය හා වාහනයේ වේගය | |

9) $(a+1)(a+3)$ ද්විපද ප්‍රකාශන දෙකෙහි ගුණිතය ප්‍රසාරණය කර සුළු කරන්න.

10) රුපියල් 1000කට ගත් භාණ්ඩයක් රුපියල් 800ට විකිණීමෙන් සිදුවන අලාභයේ ප්‍රතිශතය සොයන්න.

11) $A\hat{O}B = C\hat{O}D$ නම් $A\hat{O}C = B\hat{O}D$ බව පෙන්වීමට පහත හිස්තැන් පුරවන්න.

$A\hat{O}B = C\hat{O}D$ (දත්තය)

$A\hat{O}B +$ …………….. $= C\hat{O}D +$ …………….. (ප්‍රත්‍යක්ෂයෙන්)

$\therefore$ $A\hat{O}C$ $= B\hat{O}D$




12) $x$ හි අගය සොයන්න.




13) සාධක සොයන්න. $3P^2 - 75$

14) $x = \frac{1}{2}, y = -1$ විට $4x + 6y$ හි අගය සොයන්න.

15) දී ඇති  රූපයේ $AB$ හා $BC$ පාද වලට සමදුරින් ගමන් ගන්නා ලක්ෂ්‍යයක පථය නිර්මාණය කරන්න.




16) 273000 විද්‍යාත්මක අංකනයෙන් ලියන්න.

17) ප්‍රස්තාරයේ දල සටහන අනුව දී ඇති ශ්‍රිතයේ සමීකරණය ලියා දක්වන්න.




18) දී ඇති ප්‍රකාශනය සුළු කර පිළිතුර ධන දර්ශක සහිතව ලියන්න. $\frac{x^2 \times 3x^{-4}}{x}$

19) $P = a + dn$ සූත්‍රයේ $n$ උක්ත කරන්න.

20) සුළු කරන්න. $3\frac{3}{4} \div \frac{5}{8}$

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1) පඨ හා නිර්මාණ පාඩම සඳහා ඔබ පාසලේ දී කළ ක්‍රියාකාරකම් මතක් කර ගනිමින් මූලික පඨ පිළිබඳව දැනුම ද භාවිතා කර පහත නිර්මාණ එකම රූපයක් තුළ කරන්න.

i. $AB = 6cm$ වන සේ වූ සරල රේඛාවක් නිර්මාණය කරන්න.

ii. $AB$ සරල රේඛාවේ ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

iii. $AB$ මත ලම්බ සමච්ඡේදකය හමුවන ස්ථානය $C$ ලෙස නම් කරන්න.

iv. $A$ ලක්ෂ්‍යයේ දී $60°$ ක කෝණයක් නිර්මාණය කර එය ලම්බ සමච්ඡේදකය හමුවන ලක්ෂ්‍යය $D$ ලෙස නම් කරන්න.

v. $DC$ හි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කර එය $AD$ හමුවන ලක්ෂ්‍යය $O$ ලෙස නම් කරන්න.

vi. $O$ කේන්ද්‍රය ද $OA$ අරය ද වන වෘත්තය නිර්මාණය කරන්න.

vii. $A\hat{D}C$ කෝණයේ කෝණ සමච්ඡේදකය $AC$ පාදය හමුවන ලක්ෂ්‍යය $P$ ලෙස ලකුණු කරන්න.

viii. නිර්මාණය තුළ ඔබට දැකිය හැකි සෘජුකෝණී ත්‍රිකෝණයක් සඳහා පයිතගරස් සම්බන්ධය ලියා දක්වන්න.

2)

a) ත්‍රිකෝණයක පාදයක් දිග් කළ විට සෑදෙන බාහිර කෝණය හා අභ්‍යන්තර කෝණ අතර සම්බන්ධය දක්වෙන ප්‍රමේයය ලියා දක්වන්න.

b) රූපයේ $a + b + c$ හි අගය $x + y + z$ හි අගය මෙන් කී ගුණයක් ද?




c) රූප සටහන ඇසුරින් දී ඇති $p, q, r, s$ කෝණවල විශාලත්වය සොයන්න.




3) $y = x - 2$ ප්‍රස්තාරය ඇඳීමට සකස් කළ අසම්පූර්ණ වගුවක් පහත දක්වා ඇත.

| $x$ | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|
| $y$ | -4 | -3 | ....... | ....... | 0 | 1 |

i. වගුවේ හිස්තැන් පුරවන්න.

ii. සුදුසු බණ්ඩාංක තලයක ප්‍රස්තාරය අඳින්න.

iii. $y = -1\frac{1}{2}$ වන විට $x$ හි අගය ප්‍රස්තාරය ඇසුරින් සොයන්න.

iv. ඉහත රේඛාවට සමාන්තරව $(0, 3)$ ලක්ෂ්‍යය හරහා යන රේඛාවේ සමීකරණය ලියන්න.

v. ඉහත (iv) හි ඔබ නම් කළ රේඛාවේ අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය ලියා දක්වන්න.

4) (a) -5, -2, 1, 4, .... සංඛ්‍යා රටාවේ

i. පොදු අන්තරය සොයන්න.

ii. $n$ වන පදය වන $T_n$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

iii. $T_n$ ඇසුරෙන් 25 වන පදය සොයන්න.

iv. 103 යනු මෙම සංඛ්‍යා රටාවේ කීවන පදය ද?

(b) $T_n = 5n - 2$ සාධාරණ පදය වන සංඛ්‍යා රටාවේ මුල් පද 4 සොයන්න.

5)

i. $x^2 + 10x - 24$ සාධකවලට වෙන් කරන්න.

ii. $2m + n = 7$ ද $m - n = 2$ ද නම් $m$ හා $n$ හි අගය සොයන්න.

iii. $c = 45$ වන විට $c = \frac{5}{9}(F - 32)$ සූත්‍රයේ $F$ හි අගය සොයන්න.

iv. $\{3(x + 5) - 2\} - 3 = 16$ විසඳන්න.

6)

a) රූපයේ දැක්වෙන්නේ අර්ධ වෘත්තාකාර කොටසක් හා සෘජුකෝණී ත්‍රිකෝණයක් සංයුක්ත කර සාද ඇති නිල ලාංඡනයකි.

i. අර්ධ වෘත්තයේ චාප දිග සොයන්න.

ii. $ABD$ සෘජුකෝණී ත්‍රිකෝණයේ $AB$ පාදයේ දිග සොයන්න.

iii. සංයුක්ත රූපයේ පරිමිතිය සොයන්න.

iv. මීර 1ක් දිග වර්ණ රිබන් පටියක මිල රු.150 කි. ඉහත ලාංඡනය වටා ඇලවීමට අවශ්‍ය රිබන් පටිය සඳහා වැය වන මුදල සොයන්න.




b) $ABD$ ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.

7) (a)

i. රු.8000ට මිලට ගත් ජංගම දුරකතනයක් සඳහා 20% ක ලාභයක් ඇතිව මිල ලකුණු කරයි. ලකුණු කළ මිල සොයන්න.

ii. එය විකිණීමේ දී 5% ක වට්ටමක් ලබා දෙන්නේ නම් ලබා දුන් වට්ටම සහ ජංගම දුරකතනය විකුණන ලද මිල සොයන්න.

(b) පියෙක් තමා සතු ඉඩමකින් $\frac{2}{3}$ ක් තම පුතාට ද $\frac{1}{4}$ ක් දුවට ද බෙදා දුනි.

i. පුතාට සහ දුවට දුන් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර භාගයක් ද?

ii. පුතාට හා දුවට ලබා දුන් පසු ඉතිරි වූ ඉඩම් ප්‍රමාණය අක්කර දෙකක් නම් බෙදූ මුළු ඉඩම අක්කර කීයද?

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prabashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · T · සුතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**